**යටවත්ත ප්‍රාදේශීය සභාව**

**මාතලේ දිස්ත්‍රික්කය**

**-----------------------------**

1. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 26 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2014 ඔක්තෝබර් 03 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදි.

1.2 මතය

---------

සභාපතිවරයා වෙත යවන ලද මාගේ වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට යටවත්ත ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

--------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ). යතුරුපැදි 02 ක සහ සෙවිලි තහඩු 98ක වටිනාකම ගිණුම්ගත කර නොතිබූ අතර භෞතිකව නොතිබුණු කසළ කරත්තයේ රු.10,000ක් වූ වටිනාකම ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ). පිරිවැය රු.14,700ක්වූ ඉන්වෙන්ට්‍රි භාණ්ඩ අයිතම 07ක වටිනාකම හා අක්කර 01 පර්චස් 41ක වපසරියකින් යුත් ඉඩම් කට්ටි තුනක වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ). ගෙවිය යුතු රු.12,264ක්වූ ණයහිමි ශේෂ 06ක වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ). 2012 වර්ෂයේ විගණන ගාස්තු රු.17,926ක් වැඩියෙන්ද 2006 වර්ෂයේ විගණන ගාස්තු රු.4,963ක් අඩුවෙන්ද ගිණුම්ගත කර තිබුණි.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
--------------------------------------
පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ). ලැබිය යුතු ගිණුම්
---------------------
ලැබිය යුතු ගිණුම් ශේෂ 04ක වටිනාකම රු.303,202ක්වූ අතර, ඊට වර්ෂ 5කට වැඩි කාලයකට අයත් රු.199,108ක ශේෂ ඇතුලත් විය.

(ආ). ගෙවිය යුතු ගිණුම්
---------------------
සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ගෙවිය යුතු ණයහිමි ශේෂවල එකතුව රු.7,878,227 ක් විය.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම
-------------------------------------
අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.881,685ක්වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරික්ෂණය කිරීමට නොහැකි විය.

1.3.5 නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම
---------------------------------------------------
පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි සහ චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
| --- | --- |
| 1987 අංක15 දරන ප්‍රාදේශීය සභා පනත | |
| (i). 126 වගන්තිය | අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ගැනීමකින් තොරව ජල බවුසරය බාහිර පාර්ශවයන්ට කුලියට ලබාදී තිබුණි. |
| (ii). 175(1) වගන්තිය | පළාත් පාලන කොමසාරිස්වරයාගේ අනුමැතිය ලබා නොගෙන අනියම් සේවකයින් 03 දෙනෙකු සේවයේ යොදවාගෙන ඔවුන් වෙනුවෙන් වැටුප් හා දීමනා ලෙස රු.364,841ක් ගෙවා තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

මූල්‍ය ප්‍රකාශන අනුව සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.5,494,207ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.5,337,789ක් විය. ඉකුත් වර්ෂය සමග සැසඳීමේදි සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.156,418 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ මූල්‍ය කාර්යසාධනය පිළිබඳ වැදගත් අනුපාත කිහිපයක් පහත දැක්වේ.

(අ). මෙහෙයුම් ආදායමට අතිරික්තය සියයට 26.25ක අගයක් ගෙන තිබුණු අතර, ඉකුත් වර්ෂයේ එම අගය සියයට 30.41ක් වූයෙන් සියයට 4.16ක පිරිහීමක් විය.

(ආ). මුළු ආදායම සහ වියදම අතර අනුපාතය සියයට 73.75ක් වූ අතර, ඉකුත් වර්ෂයේ එම අනුපාතය සියයට 68.58ක් වූයෙන් අනුපාතයේ සියයට 5.17ක පිරිහීමක් විය.

2.3 ආදායම් පරිපාලනය

------------------------

2.3.1 අක්කර බදු හා ජල ගාස්තු

------------------------------

සමාලෝචිත වර්ෂය අවසානයට හිඟහිටි අක්කර බදු ශේෂය රු.146,853 වූ අතර, හිඟහිටි ජල ගාස්තු ශේෂය රු.86,839ක් විය.

2.3.2 බලපත්‍ර ගාස්තු

-----------------

සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන රු.47,510 ක් වූ හිඟ බලපත්‍ර ගාස්තු ශේෂය 2004 වර්ෂයට පෙර සිට ඉදිරියට ගෙනෙමින් පැවතින.

2.3.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරින්ගෙන් සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට රු.1,419,981 ක උසාවි දඩ සහ රු.3,082,470ක මුද්දර ගාස්තු අය විය යුතුව තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ). සභාවට අයත් කැබ් රථයක් සහ ට්‍රැක්ටරයක් 2007 වර්ෂයේ සිටද තවත් කැබ්රථයක් 2008 වර්ෂයේ සිටද අනෙක් ට්‍රැක්ටර් දෙක සඳහා 2011 වර්ෂයේ සිටද වාර්ෂික ආදායම් බලපත්‍ර ලබා නොගෙන ධාවනයට යොදවා තිබුණි.

(ආ). 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතේ 21 වගන්තිය ප්‍රකාරව, ගොඩනැගිලි සැලසුම් අනුමත කර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ දෙක තුළ ලැබී තිබුණු අයදුම්පත් 186කින් 91ක් අනුමත කර තිබුණු නමුත්, ඉන් අනුකූලතා සහතික නිකුත් කර තිබුණේ අයදුම්පත් 03ක් සඳහා පමණි.

(ඇ). භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාව හා ලෙජර් ගිණුම අතර, වූ රු.45,344 ක වෙනස නිරවුල් කිරිමට පියවර නොගෙන 2008 වර්ෂයේ සිට ගිණුම්වල ඉදිරියට ගෙනෙමින් පැවතුණි.

3.2 නිශ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

---------------------------------------

.

පිරිවැය රු.413,000ක්වූ ට්‍රැක්ටර් ට්‍රේලර 2ක් රු.28,500ක් වූ යතුරුපැදියක් සහ වටිනාකම ගණනය නොකළ කාර්යාල උපකරණ 05 ක් වර්ෂ ගණනාවක සිට නිශ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවතුණි.පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් 2013 ජූනි 18 දින සභාවට ලැබී තිබූ රු.1,463,200ක්වූ ට්‍රැක්ටරය සහ ට්‍රේලරය එදින සිට කිසිදු ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

3.3 ආර්ථික නොවූ ගනුදෙනු

-----------------------------

සමාලෝචිත වර්ෂයේදි රු.946,703ක වියදමින් ඉදිකර තිබූ නළ ළිඳෙහි ජලයේ අඩංගු ඇමෝනියා සාන්ද්‍රණය ප්‍රමිති මට්ටමට වඩා වැඩි බැවින් බීමට ගැනීමට නොහැකි තත්ත්වයක පැවතුණි.

3.4 හඳුනාගත් අලාභ

--------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණ විය.

(අ). ඉකුත් වර්ෂයේදී රු.15,178ක වටිනාකම ඇති පුස්තකාල පොත් 217ක ඌනතාවයක් අනාවරණය වී තිබුණු ද එකී වටිනාකම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ). ඉකුත් වර්ෂ 04ක් වෙනුවෙන් වාහන 04 කට ආදායම් බලපත්‍ර ලබා නොගැනීම නිසා ඒ වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදි රු.36,560ක දඩමුදල් ගෙවීමට සිදු වී තිබුණ නමුත් ඊට වගකිව යුතු අයවෙත වගකිම පවරා අලාභ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.5 කොන්ත්‍රාත් පරිපාලනය

----------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

| ප්‍රතිපාදනය | කර්මාන්තයේ නම | ඇස්තමේන්තු මුදල | පරීක්ෂා කළ දිනය | නිරීක්ෂණ |
|---|---|---|---|---|
| | | රු. | | |
| (අ).මහනැඟුම | ඩන්කන් පෙදෙස මාර්ගයේ කුට්ටිගල් අල්ලා සංවර්ධනය කිරීම | 500,000 | 2013 .10. 10 | (i) මීටර් 44ක් වූ මුළු දුර ප්‍රමාණය අතර ස්ථාන කීපයක අතුරා තිබූ අන්තර් සම්බන්ධිත කුට්ටිගල් කැඩී තිබුණි.<br>(ii) ගල් අතර වූ සිදුරු ගල් කුඩු යොදා වසා නොතිබුණි.<br>(iii)ගල් ඇතිරීමෙන් පසු රෝලක් යොදා මාර්ගය මතුපිට තලය නියමිත ආකාරයට සකස් කර නොතිබුණි. |
| (ආ).මහනැඟුම | සැලගම - නාගොල්ල සිට උඩුගම දක්වා මාර්ගය කුට්ටිගල් අල්ලා සංවර්ධනය කිරීම | 500,000 | - එම - | (i) මාර්ගය ආරම්භය 17වන මීටරය සිට අවසානය දක්වා මාර්ගය වර්ෂාවට සේදී ගොස් තිබුණි.<br>(ii) ගල් අතර පරතරය අඟල් 1සිට 1¼ දක්වා ප්‍රමාණයට ඇත්වී තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ).මහනුවර | උඩස්ගිරි - මඩදෙණිය මාර්ගය කුට්ටිගල් අල්ලා සංවර්ධනය කිරීම | 1,500,000 | - එම - | (i) මාර්ගය දෙපස කොන්ක්‍රීට් කැටගල් යෙදූ කොටස්වල වලවල් සෑදී තිබුණි.<br>(ii) ඉතා දුර්වල ප්‍රමිතියකින් යුත් කුට්ටිගල් අල්වා තිබුණි. |
| (ඇ).මහනුවර | තල්ගහගොඩ වරලත්ගම මාර්ගය කුට්ටිගල් අල්ලා සංවර්ධනය කිරීම | 500,000 | 2014 .05.07 | (i) මාර්ගය දෙපස කොන්ක්‍රීට් ආවරණ බැම්ම අඟල් 9×6 වෙනුවට අඟල් 6×6 ප්‍රමාණයෙන් යෙදීම නිසා දිග මීටර් 180ක් වෙනුවෙන් රු.65,500ක් වැඩිපුර ගෙවා තිබුණි.<br>(ii) මාර්ගයේ අතුරා තිබූ කුට්ටිගල් නියමිතප්‍රමිතියට නොතිබූ අතර, ගල් මතුපිට කැඩී පලුදුවී තිබුණි. |
| (ඉ).කඳුරට උදාන | දොඹවෙල කොස්කොටුව මාර්ගය කොන්ක්‍රීට් ඇතිරීම. | 148,748 | 2013.07.23 | (i) කොන්ක්‍රීට් මිශ්‍රනය නිසි ප්‍රමිතියකින් යොදා නොතිබුණු බව මාර්ගයේ ස්ථාන 03 ක් කඩා පරික්ෂා කිරීමේදී දක්නට ලැබුණි.<br>(ii) කොන්ක්‍රීට් ඇතිරීම සඳහා ඝන මීටර් එකක් රු.11,413 බැගින් ඝ.මී. |

| | | | | |
|---|---|---|---|---|
| | | | | 2.92ක් සඳහා රු.33,256ක් වැඩිපුර ගෙවා තිබුණි. |
| (ඊ).කඳුරට උදාන | අස්ගිරිය - දොරකුඹුර ගල්කන්ද මාර්ගය කොන්ක්‍රීට් ඇතිරීම. | 198,761 | 2014 .05 .07 | (i) කොන්ක්‍රීට් මිශ්‍රණය නියමිත ප්‍රමිතියකට නොතිබුණි.<br>(ii) අඟල් 4 සකනමට යෙදිය යුතු කොන්ක්‍රීට් අඟල් 2.6ක් සනකමට යෙදීම නිසා රු.68,478ක් වැඩිපුර ගෙවා තිබුණි. |
| (උ).කඳුරට උදාන | බටහිරවත්ත මාර්ගය කොන්ක්‍රීට් ඇතිරීම. | 500,000 | 2014. 05.07 | (i) මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා ස්ථාන 14කින් මාර්ගය හරස් අතට පුපුරා තිබුණි.<br>(ii) අඟල් 4 සනකමට යෙදිය යුතු කොන්ක්‍රීට් අඟල් 2.6ක් සනකමට යෙදීම නිසා රු.169,939ක් වැඩිපුර ගෙවා තිබුණි. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

ආදායම් හා වියදම් විෂයයන් අතර වර්ෂය තුල ප්‍රතිපාදන මාරු කිරීමෙන් අනතුරුවද, ආදායම් විෂයයන් 04ක ඇස්තමේන්තුගත ආදායම හා තථ්‍ය ආදායම අතර සියයට 39 සිට සියයට 99 අතර පරාසයක විචලනයන් ද වැය විෂයයන් 45කට අදාලව ශුද්ධ ප්‍රතිපාදනය සහ වියදම අතර සියයට 17සිට සියයට 98 දක්වා පරාසයක විචලනයන් ද, පැවති අතර වැය විෂයයන් 34ක රු.1,263,500ක ප්‍රතිපාදනවලින් කිසිදු වියදමක් නොදරා වෙනත් වැය විෂයයන්ට මාරු කිරීම හෝ ඉතිරි කිරීම සිදුකර තිබුණි. ඒ අනුව අයවැය ලේඛන ඵලදායි පාලන කාරකයක් ලෙස උපයෝගි කරගෙන ඇති බවත් දක්නට නොලැබුණි.

5. පද්ධති හා පාලන

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කෙරේ.

(අ). හිඟ ආදායම් රැස්කිරීම.

(ආ). අයවැය පාලනය.

(ඇ). වත්කම් කළමනාකරණය.

(ඈ). ණයගැති හා ණයහිමි පාලනය.

(ඉ). ගබඩා පාලනය.

(ඊ). මූල්‍ය පාලනය.